දුරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507 , 011 2694033
Telephone ) 011 2675449 , 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

මගේ අංකය )
எனது இல ) NA/06/NEW/07/2021 /T
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2023.08. 09
Date )

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ජාතික රෝහල

අධ්‍යක්ෂ, ජාතික රෝහල මහනුවර

මධ්‍යම රජයට අයත් සියළුම ශික්ෂණ රෝහල්, මහ රෝහල්, මූලික රෝහල්, සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්

**<u>හෙද නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු 2022</u>**

හෙද නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු ලබා දීමට අදාළව නිකුත් කරන ලද අංක 01-32/2022 හා 2022.09.27 දිනැති ස්ථානමාරු චක්‍රලේඛය හා මගේ සමාංක හා 2023.03.31 දිනැති අභියාචනා කැඳවීම් ලිපිය හා බැඳේ. ඒ අනුව ස්ථානමාරු මණ්ඩලයේ සහ අභියාචනා මණ්ඩලයේ නිර්දේශ සඳහා සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතිය හිමි වී ඇති අතර එම අවසන් ස්ථානමාරු නියෝග ඇතුළත් ලේඛනය මේ සමඟ දක්වා ඇත.

02. එසේම, මෙම 2022 ස්ථානමාරු ලේඛනයේ දැක්වෙන වාර්ෂික ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක කිරිම සඳහා 2018 සිසු කණ්ඩායමෙන් III ශ්‍රේණියේ හෙද නිලධාරීන් ලෙස පත්වීම් ලබන හෙද නිලධාරීන් අනුප්‍රාප්තිකයින් ලෙස ලබා දීමට නියමිත වේ.

03. ඒ අනුව, මෙතෙක් බලාත්මකව පැවති 2020/2021 වාර්ෂික ස්ථානමාරු නියෝග සියල්ල (සබරගමුව පළාත හැර) නවක නිලධාරීන්ට පත්වීම් ලබා දෙන දිනයේ සිට අවලංගු කරන අතර, එදින සිට ක්‍රියාත්මක 2022 වාර්ෂික ස්ථානමාරු ලේඛනයේ ඇතුලත් නියෝග පමණි.

04. 2022 වාර්ෂික ස්ථානමාරු නියෝග සකස් කිරිමේ දී 2022.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර 04 ක සේවා කාලයක් සපුරා ඇති රේඛීය අමාත්‍යාංශයේ හා පළාත් සභා රෝහල්වල (උතුර නැගෙනහිර හැර) සේවය කරන නිලධාරීන්ට ද අපේක්ෂා රෝහල - මහරගම, ස්වසන රෝග පිළිබඳ ජාතික රෝහල - වැලිසර, ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය, ජාතික බෝවන රෝග විද්‍යායතනය, යුධ හමුදා රෝහල, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල සහ උතුර නැගෙනහිර පළාත්වල රේඛීය අමාත්‍යාංශයට හා පළාත් සභාවකට අයත් රෝහල්වල 2022.12.31 දිනට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට ද, ඔවුන් වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය අනුව ජොෂ්ඨත්වය සලකා බලා ස්ථානමාරු නියෝග ලබා දෙන ලදී.

05. මෙම ස්ථානමාරු ලේඛනයේ නිර්දේශය යන තීරුව යටතේ **"නිර්දේශ කරමු"** ලෙස සඳහන් කර ඇත්තේ ස්ථාන මාරු ලබා දීමට ස්ථානමාරු මණ්ඩලයේ නිර්දේශය ලැබී ඇති නිලධාරීන් සඳහා වේ. **"පළාත් අනුමැතියට**

**යටත්ව නිර්දේශ කරමු"** ලෙස සඳහන්ව ඇති නිලධාරීන් සඳහා පළාත් එකඟතාවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මෙම අමාත්‍යාංශය මගින් සිදු කරන අතර අදාළ එකඟතා ලද පසු එම නිලධාරීන් පළාත් සභා වෙත ස්ථිරව මුදා හැරීමට නියමිතය. **එසේම පළාත් අනුමැතිය නොලැබුනහොත් එම ස්ථානමාරු අවලංගු කිරීමට සිදුවන බව කාරුණිකව දන්වමි.**

06. මෙම ලැයිස්තුවේ ඇතුළත් සේවා කාලය පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලද්දේ අදාළ නිලධාරීන්ගේ ස්ථානමාරු අයදුම්පත්වලින් වන බැවින් එම අයදුම්පත්වල සඳහන් තොරතුරු ව්‍යාජ / අසත්‍ය බව හෙළිදරව් වුවහොත් එම තොරතුරු සපයන ලද නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන බවට දන්වා සිටින අතර එවැනි වැරදි තොරතුරු මත ලබා දෙන ස්ථානමාරු අවලංගු කිරීමට කටයුතු කෙරේ. එවැනි තොරතුරු මත ස්ථානමාරු අයදුම්පත් සහතික කළ නිලධාරීන් ද ඒ සඳහා වගකිව යුතු වේ.

07. රෝහල්වල සේවා සැපයීම් අඩාල නොවන සේ ස්ථානමාරු ස්ථාන හා පළාත් රාජ්‍ය සේවය සඳහා ස්ථිරවම නිලධාරීන් මුදා හැරීම් සිදු කළ යුතු අතර ආයතනයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියාට ප්‍රමුඛතාවය ලැබෙන ආකාරයෙන් සේවා ස්ථානයෙන් නිදහස් කිරීම යෝග්‍ය වේ. ආයතනයන්ට අදාළ කාර්ය මණ්ඩලය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දී ඇති සංඛ්‍යාවට අනුකූලව ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යන ලෙස ද මෙයින් ඔබට දැනුම් දෙනු ලැබේ.

08. අවසන් ස්ථානමාරු නියෝග ඇතුලත් ලේඛනය සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි **(www.health.gov.lk)** පල කර ඇති අතර, ස්ථානමාරු සම්බන්ධ තීරණය පෞද්ගලිකව කිසිම නිලධාරියෙකුට දැනුම් දෙනු නොලැබේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ අදාළ වන සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

09. මෙම ස්ථානමාරු නියෝග හෙද සේවයේ III ශ්‍රේණිය සඳහා නවක නිලධාරීන්ට පත්වීම් ලබා දෙන දින සිට බලාත්මක වේ.

කේ.එම්. වත්සලා ප්‍රියදර්ශණී
අතිරේක ලේකම් (පාලන) II
ලේකම් වෙනුවට.

කේ.එම්.වත්සලා ප්‍රියදර්ශණී
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10

පිටපත :

1. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරු - අ.ක.ස. / දැ.ග.ස.
2. සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු - අ.ක.ස. / දැ.ග.ස.
3. සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු - අ.ක.ස. / දැ.ග.ස.
4. සියලුම පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරු - අ.ක.ස. / දැ.ග.ස.

දුරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507 , 011 2694033
Telephone ) 011 2675449 , 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

මගේ අංකය )
எனது இல ) NA/06/NEW/07/2021 /T
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2023.08. 09
Date )

Deputy Director General , National Hospital of Sri Lanka
Director, National Hospital Kandy
All Heads of Teaching Hospitals, General Hospitals, Base Hospitals and
Health Institutions under the Line Ministry

**Annual Transfers of Nursing Officers - 2022**

This is with reference to the circular No.01-32/2022 dated 27.09.2022 issued for calling application to the annual transfers of Nursing Officers and the letter of my even number dated 31.03.2023 issued for calling appeals. Accordingly the approval of the Health Secretary has been received for the recommendation made by the Transfer Board and the Appeal Board. The list of the final transfer orders is appended herewith.

02. And the successors are to be provided from the student nurses' batch 2018 as Grade III Nursing Officers to implement the annual transfer orders given in this transfer list 2022.

03. Accordingly all annual transfer orders 2020/2021 which were effective upto now (except Sabaragamuwa Province) are cancelled from the date when granting the appointments for new Nursing Officers. Only the transfer orders in the annual transfer list of 2022 should be implemented from the said date.

04. When preparing the annual transfer orders of 2022 it was concerned that the Nursing Officers who have completed a service period of 04 years in the hospitals under Line Ministry and Provincial Councils (except Northern / Eastern Provinces) as at 31.12.2022 and the Nursing Officers who have completed 02 years as at 31.12.2022 in the Apeksha Hospital - Maharagama, National Hospital for Respiratory Diseases - Welisara, National Institute of Mental Health, National Institute of Infectious Diseases, Army Hospital, Wijayakumarathunga Memorial Hospital, Dr. Neville Fernando Teaching Hospital, Hospitals under the Line Ministry and Provincial Hospitals in Northern / Eastern Provinces with considering their seniority based on the dates of assumption of duties at the present service station.

05. In the transfer list **"Recommended"** has been mentioned for the Nursing Officers who have received the recommendation of the Transfer Board for transfer. **"Recommended under the approval of Provincial approval"** means that those officers will be released permanently to the Provincial Councils concerned on receipt of the Provincial consent. And it is kindly informed that if the provincial consent is not received, such transfer orders will have to be cancelled.

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

06. If the particulars furnished in the applications are found to be false, disciplinary action will be taken, against the officers who have furnished such information, since particulars related to the service period of officers were obtained from the transfer applications submitted by the Nursing Officers. Accordingly action will be taken to cancel the transfer orders issued based on such false particulars and the Officers who certified applications with containing such false particulars should responsible to that mistake.

07. Officers should be released permanently for the transfer stations and for the Provincial Public Service as it should not be affected the services in hospitals. It is appropriate to give priority to the most senior officer in your institute in releasing the officers from the present service station. It is hereby informed to keep the staff of your institute conforming to the number approved by the Department of Management Services.

08. The final list of the annual transfer orders is published on the website of the Ministry of Health (www.health.gov.lk) and no officer will personaly be informed the decisions taken on transfers. Accordingly, please take action to bring the contents of the Transfer list to the notice of all relevant officers of your institute.

09. These transfer orders are effective from the date when granting the new appointments for the newly recruited grade III Nursing Officers.

K.M. Wathsala Priyadarshani
Additional Secretary (Admin) II
For Secretary.

K.M.Wathsala Priyadarshani
Additional Secretary (Admin) II
Ministry of Health
" Suwasiripaya "
Colombo 10

Copy :

1. Chief Secretaries of all the provinces - N.A.P. / I.F.P.
2. Secretaries of all the Provincial Public Service Commissions - N.A.P. / I.F.P.
3. Health Secretaries of all the Provinces - N.A.P. / I.F.P.
4. Health Directors of all the Provinces - N.A.P. / I.F.P.